DEPARTMENT OF STATE · UNITED STATES OF AMERICA

BAM

DANCE MOTION USA



photo: ODC/Dance by Mona Baroudi

# ඇමෙරිකානු නූතන නාට්ය පිළිබඳ කෙටි ඉතිහාසයක්

චාර්මැයින් පැට්ට්රිකා වොරන්, සුසේන් යොන්ජර්මන්, සුසාන් යුන්ග්

2013

BAM

# ඩාන්ස්මෝෂන් යූඑස්ඒ පිළිබඳ සටහනක්

ඇමරිකානු නාට්‍ය පිළිබඳ තොරතුරු ගෝලීය ජනතාවට ලබාදීම සඳහා මෙම නිබන්ධනය ඩාන්ස්මෝෂන් යූඑස්ඒ විසින් නිෂ්පාදනය කරන ලදී. ඩාන්ස්මෝෂන් යූඑස්ඒ යනු ඇමරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යාපනික සහ සංස්කෘතික කටයුතු පිළිබඳ කාර්යාංශයේ වැඩසටහනක් වන අතර සංගීතය පිළිබඳ බෘක්ලින් ඇකඩමිය (Brooklyn Academy of Music) විසින් අන්‍යෝන්‍ය අවබෝධය සඳහා පහසුකම් ඇති කරමින් සමකාලීන උසස් ඇමරිකානු නාට්‍ය විදේශයන්හි පෙන්වීම සඳහා නිෂ්පාදනය කරන ලද්දකි. ඩාන්ස්මෝෂන් යූඑස්ඒ විසින් ප්‍රධාන සංස්කෘතික, සමාජ සේවා සහ ප්‍රජා මූලික ආයතනයන් සහ අධ්‍යාපනික ආයතනයන් සමඟින් හුවමාරුව සහ බැඳීම සඳහා ඉඩදෙනු ලබන අසමසම නවාතැනක් නිර්මාණය කිරීම සඳහා ඇමරිකානු තානාපතිකාර්යාල හවුල්කරුවන්ට උදව් ලබා දේ. එයට අමතරව, පුද්ගලයාගෙන් පුද්ගලයාට මැදිහත්වීම තුළින්, ක්‍රියාශීලී සමාජීය සහ ඩිජිටල් මාධ්‍ය මුල්පිරීම් තුළින් සහ තානාපති කාර්යාල සහ කොන්සල් කාර්යාලවල පුස්තකාල මඟින් මෙම වැඩසටහන පුළුල් ප්‍රේක්ෂක පිරිසක් කරා ළඟාකර ගනී.

**කරුණාකර අපගේ dancemotionusa.org වෙබ් අඩවිය බලන්න**

DANCE MOTION USA

BAM

# කර්තෘවරුන් පිළිබඳ

වාර්මැයින් පැට්ට්රිකා වොරන්

වාර්මැයින් පැට්ට්රිකා වොරන් නාට්‍ය ශිල්පිනියක්, ඉතිහාසඥයෙක්, උපදේශිකාවක් සහ නාට්‍ය රචනා කරන්නියකි. එමෙන්ම ඇය හන්ටර් කොලිජියේ, කීන් විශ්ව විද්‍යාලයේ, දුරස්ථ අධ්‍යාපනය පිළිබඳ එම්පයර් රාජ්‍ය විදුහලේ මාර්ගගත වැඩසටහන් මධ්‍යස්ථානයේ සහ ජෙෆ්රි බැලට් පාසලේ ජෑස් සහ සමකාලීන පුහුණු වැඩසටහනේ අධ්‍යාපනික පීඨ සාමාජිකාවකි. වොරන් මහත්මිය ඇයිලි පාසලේ සහ ඇයිලි/ෆොර්දම් විශ්ව විද්‍යාලයේ නාට්‍ය පිළිබඳ ප්‍රධාන වැඩසටහනේ හිටපු පීඨ සමාජිකාවකි. ඇය හොවාර්ඩ් විශ්ව විද්‍යාලයේ ඉතිහාසය පිළිබඳ පීඑච්ඩී උපාධිය, කනි- සිටි කොලිජියේ (CUNY - City College) නාට්‍ය පර්යේෂණ, ප්‍රතිනිර්මාණය සහ මුද්‍රා නාට්‍ය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ මොන්ට්ක්ලෙයර් රාජ්‍ය විදුහලෙන් කථාව සහ වේදිකාව/ නාට්‍ය පිළිබඳ උපාධියක් සහ ඉංග්‍රීසි පිළිබඳ උපාධියක්ද ලබාගෙන ඇත.

වොරන් මහත්මිය ප්‍රවීනතාවය දක්වන ක්ෂේත්‍රයන්ට බටහිර නාට්‍ය ඉතිහාසය, ඇමරිකානු නාට්‍ය තුළ කලු සම්ප්‍රදාය, සහ ජැමෙයිකානු නාට්‍ය ඇතුළත් විය. ඇය 1989 - 2000 දක්වා අන්තර් ජාතිකව ප්‍රසිද්ධ ඩේවිඩ් රූසෝ/රියලිටි ඇතුළත්ව ප්‍රධාන නිව්යෝර්ක් නාට්‍ය සමාගම් සමග වසර කිහිපයක්ම කටයුතු කලේය. ඇය නූතන නාට්‍ය, සමකාලීන ශෛලීන් සහ යෝග මත පදනම්ව චලනය පිළිබඳ පන්තියක ඉගැන්වීය. .

වොරන් මහත්මිය හාර්ලිම් වේදිකා නාට්‍ය මාලාවේ, ඊ-චිත්‍රපටි (E-Moves) වල සමපාලක වූ අතර (The Wassaic Project Festival). හි නාට්‍යවල ප්‍රධාන පාලක විය. වොරන් මහත්මිය වසර දහයකට වඩා වැඩි කාලයක් නිව්යෝර්ක් නාට්‍ය සහ රංග කලා ත්‍යාග කමිටුවේ (BESSIES) සාමාජිකාවක්ද විය.

ඇය දැනට ඩාන්ස් මැගසින් සහ වෙනත් ප්‍රකාශන අතර නිව්යෝර්ක් ඇම්ස්ටර්ඩෑන් නිවුස් සඳහා නාට්‍ය පිළිබඳ රචනා කරයි. මෑතකාලීන රචනාවන් *JW Marriott's* වෙබ් අඩවියේ සහ ස්ටීවන් සෙරෆින් විසින් සංස්කරණය කළ BAM's 150ස්වැනි සාංවත්සරික සංග්‍රහයේ සොයා ගත හැකිය.

සුසේන් යොන්ගර්මන්

සුසෙයින් යොන්ගර්මන් BAM's අධ්‍යාපන සහ මානව පිළිබඳ දෙපාර්තමේන්තුවේ පාලක උපදේශිකාව වන අතර ඇය මෙයට පෙර මෙම ආයතනයේ අධ්‍යාපනය සහ පවුල් වැඩසටහන් පිළිබඳ හිටපු අධ්‍යක්ෂවරියද වේ. BAM හි ඇයගේ තනතුර භාර ගැනීමට පෙර, ඇය 1994දී කලාවන් පිළිබඳ ජාතික පදක්කම ප්‍රදානය කරනු ලැබූ කලාව පිළිබඳ උගන්වන ආයතනයක් වන, නිව්යෝර්ක් හි යන්ග් ඔඩියන්ස්හී වැඩසටහන් අධ්‍යක්ෂකවරිය වූ අතර චලන අධ්‍යයනයන් පිළිබඳ ලේබන්/ බාර්ටිනීෆ් ආයතනයේ විධායක අධ්‍යක්ෂවරියද විය. මෙයට පෙර, ආචාර්ය යොන්ගර්මන් නිව්යෝර්ක් විශ්ව විද්‍යාලයේ සෞන්දර්ය අධ්‍යයනයන් පිළිබඳ දෙපාර්තමේන්තුවේ උපාධිධාරී නාට්‍ය පර්යේෂණ වැඩසටහනේ, කලාව සහ විද්‍යාව පිළිබඳ උපාධිධාරී පාසලේ/කලාව පිළිබඳ ටිස් පාසලේ සහය මහාචාර්යවරිය සහ අධ්‍යක්ෂවරියද විය. ඇය ලිපි සියගණනක් ආරම්භ කිරීමට සහ සංස්කරණය කිරීමට වගකියනු ලබන නාට්‍ය පිළිබඳ අන්තර්ජාතික විශ්වකොෂයේ (ඔක්ස්ෆර්ඩ් මුද්‍රණාලය,1998) විවිධ කාණ්ඩයන් පිළිබඳ සංස්කාරක මංඩලයේද සිටියහ. ඇය බර්නාර්ඩ් කොලිජියෙන් කලා උපාධියද, කලාව පිළිබඳ මානව විද්‍යානුකූල අධ්‍යයනය තුළ විශේෂත්වය දක්වමින් මානව විද්‍යාව පිළිබඳ පීඑච්ඩී උපාධිය කොලොම්බියා විශ්ව විද්‍යාලයෙන්ද ලබාගෙන ඇත. ඇය නාට්‍යවල ඉතිහාසය සහ මානව විද්‍යාව පිළිබඳ විවිධ ලිපි පළකර ඇත.

සුසාන් යන්ග්

සංගීතය පිළිබඳ බෘක්ලින් ඇකඩමියේ ප්‍රකාශන කළමනාකාරවරිය වන සුසාන් යන්ග් විසින් වැඩසටහන්, සංස්කාරක අන්තර්ගත සහ විවිධ ව්‍යාපෘතීන් නිෂ්පාදනය කර සංස්කරණය කරන අතර BAM Blog වෙත දායක වේ. ඇය විසින් ආයතනයට වසර 150ක් පිරීම නිමිත්තෙන් එහි සැමරුම් පොත වන BAM: නිමකළ කාර්යය කෘතියේ සමකතෘවරිය වූ අතර පිනා බෝච් සහ බිල් ටී (Pina Bausch and Bill T) ඇතුළත්ව ප්‍රවීන කලාකරුවන් පිළිබඳ රචනා බොහෝමයකට දායක විය. නාට්‍ය සහ දෘශ්‍ය කලාවන් පිළිබඳ අවධානයක් ඇති නිදහස් ලේඛිකාවක් ලෙස, ඇය Ephemeralist.com වෙබ් අඩවියෙන් තොරතුරු දක්වන අතර විවිධ ප්‍රකාශනයන්ට සහ Dance Magazine, WNET's Sunday Arts blog, Pointe, Village Voice, Ballet- Tanz (Berlin), Brooklyn Rail, සහ වෙනත් වෙබ් අඩවි ඇතුළත් වෙබ් අඩවිවලට දායක වී ඇත. සුසාන් යන්ග් වසර අටක කාලයක් බැසී ත්‍යාග කමිටුවේ සේවය කළ අතර බොහෝ සංස්කෘතික දීමනා සහ ත්‍යාග ලබාදෙන සංවිධානයන්ට උපදෙස් ලබා දී ඇත.

BAM

හැඳින්වීම

ඇමෙරිකානු රාජ්‍යය නර්තනය සමඟ දියුණු වූ රටකි. ඇමෙරිකානු වීදිවල සිට වේදිකාව දක්වා නර්තනය සෑම අභිනයක්ම, සමාජ නැටුම්, සංස්කෘතික අංග, සමාජ හා දේශපාලන ගැටළු සහ ආධ්‍යාත්මික සත්වාදය යනාදී සියල්ලම නර්තනය තුළින් ග්‍රහණය කරයි. ස්වාධීනත්වය, අවදානම් භාරගැනීම, ගවේෂණය සහ අප්‍රතිහත ධෛර්යආදිය සම්මිශ්‍රණය වූ මෙම මූලාශ්‍ර ඇමෙරිකානු නවීන නර්තනය හැඩගස්වා ඇත. විවිධාකාර චලන ශබ්දමාලා, තනි පුද්ගල නාට්‍ය රචන ආවේගයන් සහ සමාජ හා සංස්කෘතික උද්වේග සහිත ඇමෙරිකානු නූතන නර්තනය අනුපමය උරගලක් සහ ජාතික වස්තුවකි.

ඇමෙරිකානු නූතන නර්තනය ආරම්භ වූ 19වැනි සියවසේ මුල් අවදියේ සිට, එය රට තුළ ප්‍රධාන සංස්කෘතික අංගයක් ද විදේශ රටවල ඇමෙරිකානු සංස්කෘතිය විදහා පෙන්වන්නා වූ කැපීපෙනෙන ලක්ෂණයක් ද විය. පරම්පරා ගණනාවක් සිය ගුරුවරුන්ගේ නර්තනය දියුණු කිරීම තුළින් හෝ ඒවාට එරෙහිව කළ අරගල තුළින් නවෝත්පාදන නිර්මාණය කිරීම හරහා අලුත් පරම්පරාවන් ඔස්සේ මෙම නර්තන වින්‍යාසය වැඩි දියුණු වී ඇත. ඉතිහාසය හෙළිදරව් කරන ආකාරයට මෙම නර්තනය ඉතා පිළිවෙලට අර්ථදක්වන ලද ශෛලියක් නොවන අතර මනුෂ්‍ය සංචලනයේ ප්‍රකාශිත විභවයන් සොයා ගැනීම සහ බෙදා ගැනීම සඳහා නිරන්තරයෙන් විකාසනය වන ගවේෂණයක් වේ.

ආරම්භය (19වැනි සියවසේ මුල් භාගය): පුරෝගාමීන්

විශාල සංස්කෘතික බලවේග රාශියක් හා බැඳුනු ඇමෙරිකානු නූතන නර්තනය ශරීරයේ හා ආත්මයේ නිදහස, ස්වයං ප්‍රකාශනය සොයායාම සහ ඇමෙරිකාවේ අති විශාල විභවය යන මනෝරාජික සංකල්පවලින් පෝෂණය වූ පරමාදර්ශවාදය සහ කැරැල්ල තුළින් මූලාරම්භනය විය. එහි ආරම්භය ඉසදෝරා ඩන්කන් (1877-1927) දක්වා දිව යයි. මුද්‍රානාට්‍ය ආකල්පයට (Isadora Duncan) සහ ජනප්‍රිය විනෝදකාමීත්වයට විරුද්ධව ප්‍රතිචාර දක්වමින් ඇය චලනයවීමේ ස්වභාවික හැඩයක් සොයා ගැනීමට සහ නර්තනය අදහස් සහ භාවයන් ප්‍රකාශ කරන්නා වූ බරපතල කලාවක් බවට පත් කිරීමට උත්සාහ කළාය. විශේෂයෙන්ම කාන්තා අයිතිවාසිකම් සම්බන්ධව සමාජය තුළ ප්‍රතිසංස්කරණය සඳහා ඇගේ නර්තනය සම්බන්ධ විය. ඇමෙරිකානු ජාතික කාන්තාවක් වුව ද ඩන්කන් මූලික වශයෙන් යුරෝපයේ දී සිය නර්තනයේ නියැලුනු අතර එහි දී ඇය සිය පාසල් ද ආරම්භ කරන ලදී - මෙය ආභාෂයේ අන්තර්ජාතික ජාලය ආරම්භ කිරීමක් විය.

ලොයී ෆුලර්, මෝඩ් ඇලන් සහ රූත් ශා (Loie Fuller), (Maud Allan), ඩෙනිස් (Ruth St. Denis) (1879-1968) සහ ටෙඩ් ෂෝන් (Ted Shawn) (1891-1927) අනෙකුත් නවෝත්පාදකයන්ට ඇතුලත් වේ. ශා. ඩෙනිස් සහ ෂෝන් සිය අනුප්‍රාණය සඳහා සංගීතයට හා වෙනත් සංස්කෘතීන්ට යොමු වූ අතර සංගීතයේ ගුණාංග කැටිවූ නර්තනය සහිත “සංගීතමය දෘෂ්ටි කල්පනය” සොයා ගන්නා ලදී. ඔවුන් නාට්‍ය රචනය ද සංචාරය ද කළ අතර ස්වදේශීය ඇමෙරිකානු, උතුරු අප්‍රිකානු, ස්පාඤ්ඤ සහ ආසියානු ශෛලීන් ඇතුලත් නර්තන වින්‍යාස සහ චාරිත්‍රවිධි අර්ථනිරූපණය කළහ.

පුරුෂ නර්තන ශිල්පීන්ගේ සමාගමක් ආරම්භ කළ ෂෝන් ශා.ඩෙනිස් සමඟ විවාහ වූ අතර ඔවුන් දෙදෙනා එක්ව ඩෙනිෂෝන් පාසල කැලිෆෝනියාවේ දී (එය පසුව නිවුයෝක්) පිහිටුවන ලදහ. මුද්‍රනාට්‍යවලට ප්‍රතිවිරුද්ධ ලෙස ඔවුන් “නව” සහ “ස්වභාවික” නර්තන ශිල්ප ක්‍රම සෙවීය. 1933 වසරේ දී මැසචුසෙට්ස්වල ෂෝන් ආරම්භ කළ නර්තන විවේකී ස්ථානය ජේකොබ්ස් පිලෝ ඩාන්ස් ෆෙස්ටිවල් (Jacob's Pillow Dance Festival) නම් උත්සවය බවට පත්

අනාවරණය සඳහා මංපෙත (1920 ගණන්වල සිට 1930 ගණන් දක්වා): පළමු පරම්පරාව

ඩෙනිෂෝවන් පුහුණු කළ නර්තන ශිල්පීන් වූ මාර්තා ග්‍රැහැම් (Martha Graham) (1894-1991), ඩොරිස් හම්ප්රි (Doris Humphrey) (1895-1958) සහ චාල්ස් වීඩ්මන් (Charles Weidman) (1891-1972) ඔවුන්ගේම නර්තනයන් නිර්මාණය කිරීම සඳහා 1920 දශකයේ මැද භාගයේ දී පමණ පාසල හැර ගියහ. සිය ගුරුවරුන්ගේ ශෛලය සහ දර්ශනය ප්‍රතික්ෂේප කළ ඔවුන් නූතන නර්තනයේ නැවත නැවත ඉස්මතු වන තේමාවන් වන පෞද්ගලික ප්‍රකාශයක් සහ ඇමෙරිකානු ජීවිතයේ ප්‍රකාශනයක් වන නර්තනයක් නිර්මාණය කිරීමට තෝරා ගත්හ.

නර්තනය තුළින් ආත්මයේ “අභ්‍යන්තරය” හෙළිදරව් වන බව විශ්වාස කළ ග්‍රැහැම් ආශ්වාස-ප්‍රාශ්වාසයේ “සංකෝචනය” සහ “මුදාහැරීම” අවධාරණය කළේය. ඇමෙරිකාව පාදක කර ගත් ෆ්‍රොන්ටියර් (*Frontier*) සහ ඇප්පලචියන් ස්ප්‍රින්ග් (*Appalachian Spring*), ග්‍රීක මිථ්‍යා ප්‍රබන්ධ (ක්ලයිටෙම්නෙස්ට්‍රා) (*Clytemnestra*), චිත්තවේග (ලැමෙන්ටේෂන්) සහ ඉතිහාසය (සෙරෆික් ඩයලොග්) (*Seraphic Dialogue*) යනාදිය ඇතුලත් නර්තන (*Lamentation*) ඇතුලත් වේ. ඇගේ සමාගම සහ පාසල ඇගේ මරණයෙන් පසු ද අඛණ්ඩව පවත්වාගෙන ගොස් ඇත.

හම්ප්රි සහ වීඩ්මන් ද පාසලක් සහ සමාගමක් ඇති කළහ. හම්ප්රිගේ තාක්ෂණ ශිල්ප ක්‍රමය පැණ නැගුනේ ස්වභාව ධර්මය විශ්ලේෂණය කිරීම

තුළිනි. “වැටීම සහ නැගිටීම”, ගුරුත්වාකර්ෂණය සඳහා ශරීරයේ ප්‍රතිචාරය තුළ ඇය නාට්‍ය කලාවක් සොයා ගත් අතර ද ආර්ට් ඔෆ් මේකින් ඩාන්සස් නම් සිය ග්‍රන්ථය හරහා නර්තන රචනය නම් විෂයය වැඩි දියුණු කරන ලදී. හම්ප්‍රි-වීඩ්මන් දෙදෙනා අමෙරිකානු විෂයයන් (ද ෂේකර්ස්) (*The Shakers*), සමාජීය ගැටළු (ලින්ච්ටවුන්) (*Lynchtown*) සහ සමාජ එකමුතුව (නිවු ඩාන්ස්) සිය නිර්මාණ සඳහා පාදක කර ගත්හ.

යුරෝපයේ (ප්‍රධාන කොට ජර්මනියේ) අවුස්ඩ්‍රක්ස්ටන්ස් (Ausdruckstanz)හෝ ප්‍රකාශනයේ නර්තනය අමෙරිකානු නර්තනයට බලපෑමක් කරමින් තිබුනි; රුඩෝල්ෆ් වොන් ලාබන් සහ ඔහුගේ ශිෂ්‍යයන් වූ කර්ට් ජූස් සහ මේරි විග්මන් මෙම නර්තන ක්‍රමයේ ප්‍රමුඛයන් වූහ. 1931 වසරේ දී ඇමෙරිකාවට පැමිණි විග්මන්ගේ ශිෂ්‍යයෙක් වන හන්යා හොල්ම් (Hanya Holm) (1893-1992) මෙම ක්‍රමය ඇමෙරිකාවට රැගෙන ආවේය.

1930 දශකයේ දී නූතන නර්තනය නවරැල්ලේ සිට පිළිගත් කලා කෘතියක් බවට පරිවර්තනය විය. විශ්ව විද්‍යාල එය භෞතික අධ්‍යාපනය හෝ රංගන කලා දෙපාර්තමේන්තුවලට ඇතුලත් කර ගන්නා ලදී. වර්මොන්ට්වල පිහිටි බෙනින්ටන් විද්‍යාලයේ ඇති කරන ලද බෙනින්ටන් ග්‍රීස්ම ඍතු නර්තන පාසල (Bennington Summer School of Dance) (1934-1942) උත්සව සංවිධානය කළ අතර මෙය නර්තන ශිල්පීන්, නර්තන රචකයන් සහ ගුරුවරුන් හට සිය පුහුණුවීම් සඳහා සුදුසු ස්ථානයක් විය. සංගීත අධ්‍යක්ෂකවරයෙක් සහ නර්තන රචක ගුරුවරයෙක් වූ ලොයිස් හෝස්ට් (1884-1964) මාර්තා ග්‍රැහැම් සමඟ සමීප සම්බන්ධතා පැවැත්වූ අතර විශ්ව විද්‍යාල, නර්තන පාසල් සහ උත්සවවල ඉගැන්වීමේ කටයුතුවල නියැලුනි. විශ්ව විද්‍යාල ද ප්‍රමුඛ පෙළේ නියෝජිතයන් සහ නර්තන ඉදිරිපත්කරන්නන් ලෙස කටයුතු කරන ලදී. නර්තන රචක බ්රෙන්ඩා වේ 1976 වසරේ දී සැන්ෆ්‍රැන්සිස්කෝ නුවරට යැමට පෙර 1971 වසරේ දී ඔහියෝවල ඔබේලින් විද්‍යාලයේ දී ඕඩීසී/ඩාන්ස් සමාගම (ODC/Dance) පිහිටුවීය.

මීට සමගාමීව, අප්‍රිකානු-අමෙරිකානුවන් ද අමෙරිකානු නර්තනය තුළ සුවිශේෂී හඬක් නිර්මාණය කරමින් සිටියහ. දැඩි ජාතිවාදී කලබලයක් පැවති හාලෙම් පුනරුදය සමයේ දී හැම්ස්ලි වින්ෆීල්ඩ් (Hemsley Winfield) (1906-1934), එඩ්නා ගයි (Edna Guy) (1907-1982) (ඔහු ද ඩෙනිෂෝන් පාසලේ අධ්‍යාපනය ලැබීය) සහ සියෙරා ලියෝන් ජාතිකයෙක් වූ ඇසදාතා ඩෆෝරා (Asadata Dafora) (1890-1965) නර්තන, නාට්‍ය සහ මුද්‍රා නාට්‍යය රචනා කිරීම, නිෂ්පාදනය සහ ඉදිරිපත් කිරීම සිදු කලහ. වින්ෆීල්ඩ් සහ ගයි 1931 දී නිවු යෝක් නුවර දී ද ෆස්ට් නීග්රෝ ඩාන්ස් රිසයිටල් ඉන් අමෙරිකා (*The first Negro dance recital in America)* යන මාතෘකාවෙන් යුත් රංගනයක් ඉදිරිපත් කළ අතර ඩෆෝරා විසින් නර්තන නාට්‍යය කෙරෙහි ඇති අප්‍රිකානු ආභාසය පිළිබඳව විශේෂාංගයක් ඉදිරිපත් කළේය.

කැතරින් ඩන්හැම් (Katherine Dunham) (1909-2006) බැලට් නීග්රෝ (Ballet Negre) නම් නූතන නර්තන සමාගම පිහිටුවන ලදී. ඇය විශේෂයෙන්ම හයිටි වැනි කැරිබියානු-අප්‍රිකානු ඩයස්පෝරාවේ නර්තනය පිළිබඳව පර්යේෂණ පැවැත්වීය. ඇගේ වැදගත් ශිල්පක්‍රමය අප්‍රිකානු නර්තනයෙන් ආභාසය ලැබූවක් විය. නැගෙනහිර ශා. ලූසියාවල ක්‍රියාකාරී ලෙස ප්‍රජා සංවර්ධන වැඩකටයුතුවල නියැලි පාසලක් ඇය පිහිටුවන ලද අතර ඇගේ උරුමය පිළිබඳ කථාන්දර වේදිකාවට ගෙනෙන ලදී. ල’අග්’යා (*L’Ag’Ya*), බැරල්හවුස් බ්ලූස් (*Barrelhouse Blues*) සහ ස්ටෝම් වෙදර් (*Stormy Weather*) චිත්‍රපටයේ නර්තන රචනය මේ සඳහා උදාහරණ වේ. ටැලේය් බියැටි (Talley Beatty) (මෝනර්ස් බෙන්ච් (Mourner’s Bench)), සිල්වියා ෆෝර්ට් (Syvilla Fort), සහ (Walter Nicks) වෝල්ටර් නික්ස් ආදී කලු ජාතික සම්ප්‍රදායේ නර්තන රචකයන් ඇගේ ආභාසය ලැබූ ශිල්පීන් වෙති. ඩන්හැම් තාක්ෂණය වැදගත් ශිල්පක්‍රමයක් ලෙස තවදුරටත් ඇත.

අප්‍රිකානු-ඇමරිකානු ජාතිකයෙක් නොවූව ද හෙලන් ටැමිරිස් (*Helen Tamiris*) (1905-1966) නර්තන රචනය කළ නර්තන මාලාව වන නීග්රෝ ස්පිරිචුවල්ස් (*Negro Spirituals*) පිළිබඳව ඉතා ජනප්‍රියත්වයක් ඉසිලූ ශිල්පියෙක් විය. හොල්ම්ගේ ශිෂ්‍යයන් ආරම්භ කළ නිවු ඩාන්ස් ගෘප් (New Dance Group) සමාගම සමාජ ගැටළු ඉලක්ක කර ගත්තක් විය. හම්ප්‍රි-වීල්මන් සහ කලු ජාතිකයන්ගේ සංස්කෘතිය මෙම කණ්ඩායමේ නර්තනවලට ඇතුලත් විය. ලෙස්ටර් හෝර්ටන් (Lester Horton) (1906-1953) නර්තන රංගශාලාව කැලිෆෝනියාවේ ලොස් ඇන්ජලීස්වල ජීවත් වූ ජනවාර්ගික කණ්ඩායම්වල චලන ශෛලීන්වලින් ආභාසය ලැබූවක් වූ අතර එය ජාතිකත්වය අනුව සමෝධානය වූ පළමු අමෙරිකානු නර්තන සමාගම්වලින් එකක් විය.

අමෙරිකානු නූතන නර්තනයේ විවිධ පැතිකඩ රාශිය (1940 – 1950 දශක): දෙවැනි පරම්පරාව

1950 දශකයේ දී ප්‍රධාන නර්තන සමාගම්වල නර්තන ශිල්පීන් කණ්ඩායම් ඇති කර ගත්හ. ග්‍රැහැම් සම්ප්‍රදායට අනුව, පර්ල් ලැන්ග් (Pearl Lang), සෝෆි මැස්ලෝ (Sophie Maslow) සහ ජේන් ඩඩ්ලි (Jane Dudley) මෙයට ඇතුලත් වූ අතර හම්ප්‍රි-වීල්මන් සම්ප්‍රදායට අනුව, ජෝස් ලීමන්, සිබිල් ෂියැරර් සහ කැත්රීන් ලිට්ස් සහ හෝම් සම්ප්‍රදායට අනුව, වැලරි බෙටිස්, ඇල්වින් නිකොලොයිස් සහ ඔහුගේ ශිෂ්‍යයෙක් වන මරේ ලුයිස් මෙයට ඇතුලත් විය.

BAM

ජෝසේ ලීමොන් (José Limón) (1908-1972) සිය සමාගමට හම්ජ්‍රි නර්තන රාශියක් එකතු කර ගත්තේය. ලීමොන් ඔහුගේ මෙක්සිකානු උරුමයෙන් (ල මැලින්චේ, කැර්ලෝටා (*La Malinche*, *Carlota*) ආභාසයක් ලැබූ අතර ද මුවර්ස් පවානේ (*The Moor's Pavane*) සහ දෙයාර් ඊස් අ ටයිම් (*There is a Time*). යනාදිය අනෙකුත් කෘතීන්ට ඇතුලත් වේ. ඇල්වින් නිකොලයිස් (1912-1993) සහ මරේ ලුයිස් (උපත. 1926) යන ශිල්පීන්ගේ නිර්මාණවලින් ඔවුන්ගේ ගුරුවරයා වූ හොල්ම්ගේ ජර්මානු ආභාසය කැපී පෙනුන ද ආධාරක, ඇඳුම් ආයිත්තම්, ආලෝකරණය සහ ශරීරය වෙනස් කිරීමේ රංගප්‍රයෝග භාවිතා කරමින් නර්තන රංගකලාව සම්බනධව විශාල ප්‍රසිද්ධියක් උසුලයි. අනෙක් අය ඔවුන්ගේ මූලයන්ගෙන් ඉතා විප්ලවකාරී ලෙස වෙන්වූහ. ග්‍රැහැම්ගේ ප්‍රධාන නර්තන ශිල්පීන් තිදෙනෙක් වන මර්සේ කනින්හැම්, එරික් හෝකින්ස් සහ පෝල් ටේලර් මොවුන් අතර ප්‍රධාන ශිල්පීන් විය (Merce Cunningham, Erick Hawkins, Paul Taylor).

අභිනන, ශබ්ද, චලන සහ අනපේක්ෂිත දෑ කෙරෙහි වශීකෘත වූ පර්යේෂකයෙක් වන මර්සෙ කනින්හැම් (Merce Cunningham) (1919-2009) 1945 දී ග්‍රැහැම් සමාගම අත්හැර ගොස් කථාවස්තුවෙන් ස්වාධීන වූ දුරවබෝධ ශෛලියක් (abstract style) නිර්මාණය කිරීම සඳහා 1952 දී තමාගේම සමාගමක් පිහිටුවීය. (John Cage) කනින්හැම් සහ ගීත රචකයෙක් වූ ජෝන් කේජ් විසින් සසම්භවන ක්‍රියාපිලිවෙල භාවිතා කිරීම වැනි නර්තනය යොදා ගැනීමේ විප්ලවකාරී ක්‍රම හඳුන්වා දුන්හ. සංගීතය, ඇඳුම්ආයිත්තම් සහ වේදිකා මෝස්තර යනාදිය චලනයන්ගෙන් වෙන් කරන ලදී. කනින්හැම් අවසානය දක්වාම නවෝත්පාදන බිහි කළ අතර පරිගණක මෘදුකාංග භාවිතා කරමින් චලන අදහස් උත්පාදනය සහ රේඩියෝහෙඩ් මඟින් නව සංගීතය යොදා ගනිමින් වයස අවුරුදු 90 දී පවා නර්තන රචනයේ නියැලුනි. කනින්හැම් 1952 දී බීඒඑම් (BAM) වල දී පළමු වරට සිය නිර්මාණ එළිදැක් වූ අතර 2009 වසරේ ඔහු මිය යාමට මාස කීපයකට පෙර ඔහුගේ නියර්ලි නයින්ටි (*Nearly Ninety*) නර්තනය ද මෙහි දී ඉදිරිපත් කරන ලදි.

එරික් හෝකින්ස් (Erick Hawkins) (1909-1994) ස්වභාව ධර්මයෙන් උකහා ගත් චලනයන් ගොඩනඟන ලද අතර එය ග්‍රැහැම්ගේ ශිල්පක්‍රමයේ තිබූ කලබලගතියෙන් විරුද්ධර්ථය විය. පෝල් ටේලර් (Paul Taylor) (උපත. 1930) විසින් නිදහස් ගලායාම, එල්ලා වැටෙන චලනය යන ශිල්පක්‍රමය දියුණු කළේය. ඔහුගේ නර්තනය සාරගර්භ පරාසයක දිව ගිය අතර සංකීර්ණ රටා හෝ ගීතමය රචනයේ සාරාංශයක් ද එමෙන්ම විදග්ධ, හාස්‍යය, හෝ බරපතල සමාජ සහ මනෝමය විවරණයන්ගෙන් පිරුණු රචනයෙන් ද යුක්ත විය.

පෙයාල් ප්‍රිමස් (Pearl Primus) (1919-1994) අප්‍රිකානු-අමෙරිකානු සංස්කෘතිය හා ජීවිතය පිළිබඳව විස්තර කරන ජවසම්පන්න හා අභීත නර්තන නිර්මාණය කළේය. හවුල් අස්වැන්න නෙළීම පිළිබඳව වූ හාඩ් ටයිම් බ්ලූස් (*Hard Time Blues*) සහ සාම්ප්‍රදායක ලයිබීරියානු නර්තනය පාදක කර ගත් ෆැන්ගා (*Fanga*) යන නිර්මාණ මේ සඳහා උදාහරණ කිහිපයකි. (Alvin Ailey) ඇය බටහිර අප්‍රිකානු නර්තනය ද අධ්‍යයනය කළාය. ඩන්හැම් සහ සමගාමීන් විසින් උනන්දු කරන ලද හෝ පුහුණු කළ ඇල්වින් එයිලි කාර්මෙන් ඩි ලැවල්ලාඩේ සමඟ සහයෝගයෙන් කටයුතු කළ අතර මේ සුසංයෝගයෙන් බිහිවූ ඇල්වින් එයිලි අමෙරිකානු නර්තන සමාගම (Alvin Ailey American Dance Company) 1950 දී පිහිටුවන ලදී.

නර්තනයට "බැහැ" කියන්න, සංස්කෘතික අනන්‍යතාවක් ලෙස නර්තනයේ යෙදෙන්න (1960 දශකය)

1960 දශකය අමෙරිකා එක්සත් ජනපදයේ සමාජ අරගලයක් ඇති කළ දශකයක් විය. නවීන නර්තනය මෙම තත්ත්වය නිරූපණය කළ අතර එයින් ආභාසය ලැබීය. උදාහරණයක් ලෙස, ඇතැම් කනින්හැම් නර්තන ශිල්පීන් ශිල්පක්‍රමය කෙරෙහි ඔහුගේ වැඩි අවධානය ප්‍රතික්ෂේප කළ අතර පශ්චාත්-නූතනවාදීන් ලෙස ඉස්මතුවූහ.

විශාල බලපෑමක් කළ ජඩ්සන් කාලපරිච්ඡේදය (Judson Period) (1962-1968) පෙරටුගාමී ශිල්පීන් සිය නර්තනය ඉදිරිපත් කළ ස්ථානය වූ නිව් යෝක් නගරයේ ජඩ්සන් දේවස්ථානයේ නම අනුව නම් කරන ලදී. ඩේවිඩ් ගෝර්ඩින්, ඉවෝන් රෙයිනර්, ත්‍රීෂා බ්‍රවුන්, ස්ටීව් පැක්ස්ටන් සහ ඩෙබෝරා හේ යන (David Gordon, Yvonne Rainer, Trisha Brown, Steve Paxton, Deborah Hay) මේ විප්ලවවාදීන් කනින්හැම්ගේ සගයෙක් වූ රොබට් ඩන් විසින් පවත්වන ලද ව්‍යාපාරයේ වැඩමුළුවක දී එකට කටයුතු කළ අතර ඒ අනුව 1962 දී සිය පළමු ප්‍රසංගය ජඩ්සන් දේවස්ථානයේ දී ඉදිරිපත් කළහ. මෙරේඩිත් මොන්ක්, ලුසින්ඩා චයිල්ඩ්ස් සහ කෙනෙත් කින්ග් යනාදීන් ද අනෙකුත් නර්තන රචකයන් අතර විය (Meredith Monk, Lucinda Childs, Kenneth King).

ඉවෝන් රෙයින්ර් (Yvonne Rainer) (උපත 1934) ඇගේ 1965 පවත්වන ලද "නෝ මැනිෆෙස්ටෝ" (No Manifesto) හි දී පශ්චාත්-නූතනවාදීන්ගේ කටයුතු ලුහුඬින් දැක්වීය. රෙයින්ර්ගේ ට්‍රියෝ ඒ (*Trio A*) මඟින් ජැඩ්සන් නර්තන රචකයන් ගවේෂණය කළ අවමවාදය නිරූපණය කරන අතර නර්තනයේ නියම ස්වභාවය ප්‍රශ්න කළ ඔවුන් චලනය යනු ස්වයං-ප්‍රකාශනයක් නොව ගැටළු නිරාකරණය කරන දෙයක් ලෙස දුටුවෝය. නර්තන ශිල්පීන් නොවන තැනැත්තන්, එදිනෙදා චලන

BAM

යොදා ගත් ඔවුන් අසමමිත ස්ථානවල, ශිල්පීන් සහ ප්‍රේක්ෂකයන් අතර ඇති මායිම් බොඳ කරමින් සිය නර්තන ඉදිරිපත් කළහ. ස්ටීව් පැක්ස්ටන් සහ අනෙක් අය යෝජනාකරුවන් අතර බර දීම සහ ගැනීම යන අර්ථය ගෙන දෙන්නා වූ සම්බන්ධතා අනුප්‍රතිපාදනය ගොඩනඟන ලදී.

1960 දශකය ප්‍රශ්න නැඟූ දශකයක් විය: නූතන නර්තනය තුළින් චලනය, පෞද්ගලික හෝ සංස්කෘතික ප්‍රකාශනය, කථාන්දරකීම, හෝ දේශපාලන/ සංස්කෘතික ගැටළු ආදිය ගවේෂණය කළ යුතුද? චලනය ස්වභාවික හෝ නිර්මාපිත විය යුතුද (පුහුණු සහ කලාත්මක)?

අප්‍රිකානු-අමෙරිකානුවන් වූ අයිලි (Donald McKayle), ඩොනල්ඩ් මැක්කේලි, බියැටි සහ අනෙක් අය නර්තනය යනු ක්‍රියාවලියේම කොටසක් වන ජනතාවට සන්නිවේදනය කිරීමක් ලෙස අවධාරණය කළහ. 1960 දශකයේ සිවිල් (Jeraldyne Blunden) අයිතිවාසිකම් ව්‍යාපාරය 1968 දී ඩේටන් කන්ටෙම්පොරරි ඩාන්ස් කම්පැනි (Dayton Contemporary Dance Company) ඇති කළ ජෙරල්ඩයින් බ්ලන්ඩන් වැනි කලු ජාතික නර්තන ශිල්පීන්ට අනුප්‍රාණ සැපයූ නමුත් එලියෝ පොමාරේ, රොඩ් රොජර්ස්, ඉෂ්මායෙල් හූස්ටන් ජෝන්ස්, බ්ලොන්ඩෙල් කමින්ග්ස් සහ කණිෂ්ඨ ගස් සොලමන්ස් (Eleo Pomare, Rod Rodgers, Ishmael Houston Jones, Blondell Cummings, Gus Solomons Jr.) යනාදීන් ජඩ්සන්ගේ ආභාසය ලැබූවන් වූහ.

1960 දශකයේ දී ඇල්වින් අයිලිගේ (Alvin Ailey's) (1931-1989) සමාගම ඓතිහාසික සහ සමකාලීන තේමාවන් රැගත් සුවිශේෂී නර්තන රචනය තුළින් ප්‍රමුඛ තලයකට දියුණු විය. එතැන් සිට ඇල්වින් අයිලි අමෙරිකානු නර්තන රංගකලාව (Alvin Ailey American Dance Theater) රටවල් 70කට වැඩි සංඛ්‍යාවක සිය නිර්මාණ ඉදිරිපත් කර ඇති අතර රාජ්‍ය දෙපාර්තමේන්තුවක අනුග්‍රහය ඇතිව 1970 දී අමෙරිකාව නියෝජනය කරමින් රුසියාවේ සංචාරය කළ පළමු අප්‍රිකානු-අමෙරිකානු සමාගම බවට ද පත් විය. බ්ලූස් සූට් (*Blues Suite*) සහ රිවිලේෂන් (*Revelations*)යන අප්‍රිකානු-අමෙරිකානු සංස්කෘතිය පිළිබඳ අයිලි සමාගමේ නිර්මාණ ඉතා ජනප්‍රිය විය. රිවිලේෂන්ස් (Revelations) මඟින් වෙන්කර තැබීමේ පීඩාව සහ විශ්වාසයේ භූමිකාව නිරූපණය කරයි. මෙම සංගීත සමූහයට නර්තන රචකයන් රාශියක් ඇතුලත් වෙති. ඩන්හැම්, ප්‍රිමුස්, බියැටි සහ මැක්කේලි සහ ජෝර්ජ් ෆයිසන්, කැමිලි බ්‍රවුන්, යුලිස්සෙස් ඩෝව් යන සමකාලීන නර්තන ශිල්පීන්ගේ සහ ජවෝලි විලා ජෝ සෝරා, රොනල්ඩ් කේ. බ්‍රවුන් සහ රෙනී හැරිස් (George Faison, Camille Brown, Ulysses Dove) නර්තන රචකයන්ගේ නිර්මාණ වසර 50කටත් වැඩි කාලයක් තිස්සේ සමාගම සහ අයිලි පාසල (The Ailey School) මඟින් ඉදිරිපත් කර ඇත.

නර්තනයේ අන්තර්ගත වාර්ගික අනන්‍යතාවය ක්‍රමයෙන් වර්ධනය වන නැඹුරුතාවකි. ග්‍රැහැම්ගේ අඩිපාරේ ගිය ඔහුගේ ගෝලයන් වූ මැස්ලෝ සහ ලැන්ග් යුදෙව් සංස්කෘතිය තුළින් ආභාසය ලැබූවන් වේ. කේයි ටකේසි වැනි ආසියානු අමෙරිකානුවන් ජපන් චලන හා තේමාවන් යොදා ගෙන ඇත (Kei Takei).

නූතනවාදයේ පශ්චාත් අවධිය සහ මිශ්‍ර ශෛලීන් (1970 දශකය)

1960 දශකයේ පර්යේෂණවේදීන් 1970 දශකයේ දී ද සිය කටයුතු කර ගෙන ගියහ. ජඩ්සන්ගේ සාමාජිකයන් වන පැක්සිටන්, ගෝර්ඩන්, රයිනර් සහ බ්‍රවුන් විශිෂ්ටයන්ගේ එකමුතුව (The Grand Union) වූ අතර ඔවුන් ජඩ්සන්ගේ දර්ශනය තවදුරටත් ඉදිරියට ගෙන ගියහ. තාක්ෂණික කණ්ඩායම සහ ප්‍රති-නර්තන/තාක්ෂණ කණ්ඩායම් ලෙස නූතන නර්තනයේ කණ්ඩායම් දෙකක් විය. ලාර් ලුබෝවිච් (Lar Lubovitch), ජෙනිෆර් මලර් (Jennifer Muller), ලුසින්ඩා චයිල්ඩ්ස්, සහ ට්වයිලා (Twyla Tharp) තාර්ප් යනාදීන් තාක්ෂණය සමඟ නර්තනය රචනා කළහ. මෙරේදිත් මොන්ක්, මාර්තා ක්ලාක් (Martha Clarke), එලිසබෙත් ස්ට්රෙබ් (Elizabeth Streb), පිලෝබෝලුස් (Pilobolus) සහ ඇනා හැල්ප්‍රින් (Anna Halprin) යන අනෙක් අයගේ චේතනාව වූයේ නර්තනය පිළිබඳ අදහස නැවත සොයා ගැනීම විය.

නර්තන-නොවන සෞන්දර්ය ශාස්ත්‍රය පිළිබඳව පර්යේෂණ කළ බ්‍රවුන්, චයිල්ඩ්ස් සහ තාර්ප් ඇතුළු 1960 – 1970 දශකවල නර්තන රචකයන් බොහොමයක් පිරිස කලාත්මක චලන, වෘත්තාන්තය සහ මුද්‍රා නාට්‍ය ආදිය වැළඳ ගත්හ. “දශක ගණනාවක පදිකවේදිකාවේ පර්යේෂණවල සිට කලාත්මක ශිල්පක්‍රම, සහ වෘත්තාන්ත අන්තර්ගතය සහිත පෙරටුගාමී නර්තනය දක්වා දියුණු වූ පළමු අමෙරිකානු සමාගම්වලින් එකක් විය.”

ත්‍රිෂා බ්‍රවුන් (Trisha Brown) (උපත 1936) සිය සමාගම 1970 දී පිහිටුවන ලදී. ඇගේ සෙල්ලක්කාර, අනපේක්ෂිත නර්තන රචනය අවස්ථා-පාදක නිර්මාණවල සිට පූර්ණ-ප්‍රමාණ මුද්‍රා නාට්‍යය දක්වා වූ පුළුල් පරාසයක් දක්වා දිවයයි. රොබට් රවුචෙන්බර්ග් කලාකරුවා සහ ලෝරි ඇන්ඩර්සන් යන ගීත රචකයා ඇගේ පාක්ෂිකයන් වූහ.

ට්වයිලා තාර්ප් (Twyla Tharp) (උපත 1941) විසින් ජඩ්සන්වාදීන් ප්‍රතික්ෂේප කළ - නර්තන ශිල්පයේ කලාත්මකභාවය සහ මුද්‍රා නාටක නූතන නර්තනය සමඟ මිශ්‍ර කිරීම යනාදිය නැවත හඳුන්වා දෙන ලදී. ඩියුස් කූපේ (Deuce Coupe)

# BAM

බීච් බෝයිස් (Beach Boys) කණ්ඩායමේ පොප් සංගීතයට අනුව, සමාගමේ සාමාජිකයන් හය දෙනෙක් සහ මුද්‍රා නාට්‍ය නර්තන ශිල්පීන් දාහතර දෙනෙක්ගේ සහභාගීත්වයෙන් සකස් කරන ලද්දකි.

කලු ජාතික නර්තන සම්ප්‍රදාය තුළ, තනිපුද්ගලභාවය වර්ධනය විය. 1970 දශකයේ දී ආරම්භ කරන ලද ඩියෑන් මැකින්ටයර්ගේ (Dianne McIntyre's) ((උපත 1946) සමාගම වන සවුන්ඩ් ඉන් මෝෂන් (Sounds in Motion) මඟින් සංගීතය සහ චලනය හරහා (වහල්භාවය, කලු ජාතිකයන් උතුරට සංක්‍රමණය වීම වැනි ) කථාන්තර ඉදිරිපත් කරන ලදි. ප්‍රාරම්භකයා වන සෝලා මැකින්ටයර් සමඟ අධ්‍යයනය කරන ලද අර්බන් බුෂ් වුමන් (Urban Bush Women) නිර්මාණයට දායක විය. ජෝඒල් හල් ඩාන්සර්ස්, ජොආන් මයර්ස් බ්‍රවුන් (පිලඩැන්කෝ), ක්ලියෝ පාකර් රොබින්සන් ඩාන්ස් එන්සම්බල්, ඈන් විලියම්ස් (ඩලස් බ්ලැක් ඩාන්ස් තියටර්) සහ ගාර්ත් ෆැගන් ඩාන්ස් යනාදී සමාගම් අනෙකුත් ශක්තිමත් කටහඬවලට ඇතුලත් වේ (Joel Hall Dancers, Joan Myers Brown (Philadanco), Cleo Parker Robinson Dance Ensemble, Ann Williams (Dallas Black Dance Theatre), Garth Fagan Dance).

විවිධාකාර සෞන්දර්ය ශාස්ත්‍රයන් සහ නර්තන පුද්ගල ඉතිහාසයන් (1980 දශකය)

1980 – 1990 දශකවල, නූතන නර්තන රචකයන් තමන්ගේම ඉතිහාසයන් සහ අනන්‍යතාව පිළිබඳ ගැටළු කෙරෙහි යොමු වූ අතර එසේත් නැත්නම් පාඨ, සංගීතය, වේදිකාව/ ඇඳුම් ආයිත්තම් මෝස්තර සහ නව තාක්ෂණය ආදී බහුවිෂය සන්දර්භයන් කෙරෙහි යොමු විය.

බිල් ටී. ජෝන්ස්/ ආර්නි සානේ නර්තන සමාගම (Bill T. Jones/Arnie Zane Dance Company) සම්බන්ධතා අනුප්‍රතිපාදනයේ, පුද්ගලික වෘත්තාන්තිය, සමාජ විවරණය, පාඨ, හුදු චලනය, සහ වෙනත් ලක්ෂණ රාශියක් ඇතිව 1983 දී ආරම්භ කරන ලදී. (අමෙරිකා එක්සත් ජනපදයේ ජනාධිපති වූ ඒබ්‍රහම් ලින්කන් පිළිබඳව වූ) ෆොන්ඩ්ලි ඩූ වී හෝප්... ෆෙර්වන්ට්ලි ඩූ වී ප්‍රේ (*Fondly Do We Hope... Fervently Do We Pray*) යන නිර්මාණය ඇතුළු අප්‍රිකානු-අමෙරිකානු ඉතිහාසය බොහෝ නිර්මාණවලට පාදක වී ඇත. ජෝන්ස් අසීරු මාතෘකා හසුරුවන බව පෙනේ. ස්ටිල්/ හියර් (*Still/Here*) ඒඩ්ස් රෝගයෙන් (සානේගේ ජීවිතය අවසන්වූයේ මෙම රෝගය හේතුවෙනි.) පීඩාවිඳීමෙන් ගැලවීම පිළිබඳව ගවේෂණය කරයි.

මාර්ක් මොරිස් Mark Morris (උපත 1956) මාර්ක් මොරිස් නර්තන කණ්ඩායම (Mark Morris Dance Group) 1980 දී ආරම්භ කරන ලද අතර විවිධාකාර සංගීත කණ්ඩායම් සහ ඔහුගේ සංගීතයට ප්‍රසිද්ධියක් උසුලයි. අරුම පුදුම තනි තාලවල සිට පූර්ණ- ප්‍රමාණ දුරවබෝධ කෘතීන්, මුද්‍රා නාටකවල නර්තන රචනය සහ සංගීත නාටක සමාගම් දක්වා ඔහුගේ කෘතීන් විසිරී ඇත. (ද නට්ක්රැකර්- The Nutcracker යාවත්කාලයක් වන) ද හාඩ් නට් (*The Hard Nut*), ල'ඇලෙග්රෝ (*L'Allegro*), ඉල් පෙන්සෙරෝසෝ එඩ් ඉල් මොඩරේටෝ (*il Penseroso ed il Moderato*) සහ මෝසාර්ට් ඩාන්සස් (*Mozart Dances*) යනාදිය පූර්ණ-ප්‍රමාණ කලා කෘතීන්ට ඇතුලත් වේ.

මුල් කාලීන නූතන නර්තනය මුද්‍රා නාට්‍යයෙන් ප්‍රතිවිරුද්ධ ලෙස අර්ථදැක්වූ නමුත් දශක ගණනාවක් තිස්සේ නූතන නර්තනය හා මුද්‍රා නාට්‍යය එකිනෙකින් පෝෂණය විය. ට්විලා තාර්ප්, මාර්ක් මොරිස් සහ ට්‍රිෂා බ්‍රවුන් යනාදී ප්‍රධාන නූතන නර්තන රචකයන් නිරන්තරයෙන්ම මුද්‍රා නාට්‍යය සහ සංගීත නාටක නිර්මාණය කළහ. අතීතයේ දී හෝම් සහ ටැම්රිස් වැනි නූතන නර්තන ශිල්පීන් බ්‍රෝඩ්වේ (Broadway) සඳහා නර්තන රචනය කළ අතර ට්විලා තාර්ප්, ගාර්ත් ෆාගන්, කැරෝල් අම්රිටාජේ සහ බිල් ටී. ජෝන්ස් ආදීන් සංගීතය සඳහා සම්මාන දිනූ නර්තන රචන නිර්මාණය කිරීමත් සමඟ අද වන විට නූතන නර්තනය බ්‍රෝඩ්වේ (Broadway) මත අලුත්ම බලපෑමක් ඇති කරයි (Karole Armitage).

අද වන විට ඉතා ප්‍රසිද්ධ නර්තන රචකයන් සහ සමාගම් වන මාර්තා ග්‍රැහැම්, මෙර්සේ කනින්හැම්, පෝල් ටේලර්, බිල් ටී. ජෝන්ස්/ ආර්නී සානේ, ට්විලා තාර්ප්, මාර්ක් මොරිස්, ට්‍රිෂා බ්‍රවුන් සහ ඇල්වින් අයිලි යනාදී සිය ආභාසය පතුරවමින් සිටිති. නූතන නර්තන රචකයන් සිය ගණනක් ඇමෙරිකාවේ සහ විදේශවල සිය නිර්මාණ ඉදිරිපත් කරති. සුසැන් මාර්ෂල්, සාරා මිෂෙල්සන්, බෙබේ මිලර්, ජෝන් ජැස්පර්ස්, ඉකෝ හා කෝමා, වැලි කර්ඩෝනා, ජේන් කම්ෆෝර්ට්, ඩේවිඩ් පාර්සන්ස්, ඩේවිඩ් ඩෝෆ්මන්, ලිස් ලේමන්, ඈනී බී-පාර්සන්, ස්ටීවන් පෙට්රොනිස්, ටෙරේ ඕ'කොනෝර්, රෙජී විල්සන්, යනීරා කස්ත්‍රෝ, මියුගල් ගුටිඑරේස්, නෝරා චිපායුමීර්, කයිලි ඒබ්‍රහම්, අසූර් බාර්ටන්, බ්‍රයන් බෲක්ස්, රෂාවුන් මිෂෙල්, ලිස් ගෙරින්, සින්තියා ඔලිවර්, යසුකෝ යොකෝෂි සහ තවත් රාශියක් දෙනා කැපී පෙනෙන නූතන අමෙරිකානු නර්තන රචකයන්ට ඇතුලත් වේ (Susan Marshall, Sarah Michelson, Bebe Miller, John Jasperse, Eiko & Koma, Wally Cardona, Jane Comfort, David Parsons, David Dorfman, Liz Lerman, Annie B-Parson, Stephen Petronio, Tere O'Connor, Reggie Wilson, Yanira Castro, Miguel Gutierrez, Nora Chipaumire, Kyle Abraham, Aszure Barton, Brian Brooks, Rashaun Mitchell, Liz Gerring, Cynthia Oliver, Yasuko Yokoshi).

BAM

අද වන විට අන්තර්ජාතික හුවමාරුව වැඩිදියුණු වී ඇති අතර ඒ අනුව නර්තන ලෝකය ද පෝෂණය වේ.. ජපාන බූටෝ, ජර්මානු තාස්තියටර් (tanztheater), සම්භාව්‍ය ඉන්දීය නර්තනය, චීන නර්තනය, සහ කැපොයිරා ආදිය අමෙරිකානු නර්තනයට බලපෑම් කරන්නා වූ නර්තන අතර වේ. සමකාලීන කලු ජාතික නර්තන රචකයන් අප්‍රිකානු සමාගම් සමඟ එක්වීම තුළින් සිය විෂය පරිචය පුළුල් කර ඇත.

නිගමනය: නූතන නර්තනය යනු කුමක් ද?

නූතන නර්තනය යන යෙදුම මඟින් පුළුල වූ විවිධාකාර ශෛලීන් සහ අන්තර්ගතයන් ඇතුලත් කර ගනී; ඇතැම් තේමාවන් හෝ චරිත එහි ඉතිහාසයේ නැවත නැවත මතුවෙයි. නූතන නර්තනය හුදු වචනමාලාවක් හෝ ශෛලියක් පමණක් නොව දෘෂ්ටි කෝණයක් ලෙසට මතුවෙමින් ඇත. කවන්ධයේ ප්‍රකාශනාත්මක විභවය හෝ ගුරුත්වාකර්ෂණය ප්‍රතික්ෂේප කිරීමට වඩා එය පිළිගැනිම ආදී පොදු චලන අභිරුචි ඇත. නමුත් මේවා ද විශ්වීය ඒවා නොවේ. නූතන නර්තනය වචනමාලාවක දක්ෂයෙක්වීම තුළින් ඇති වන්නක් නොව එය ප්‍රකාශනයේ මාධ්‍යක් ලෙස ඉදිරිපත් වී ඇත. නවෝත්පාදනය, පුද්ගලික සහ/හෝ සංස්කෘතක අනන්‍යතාවය සහ සමාජ අදාළතාවය යනාදිය අනුනාදී තේමාවන් වේ.

නර්තන රචනය සඳහා ඇති අභිලාෂය හුදු චලනයක්, කථාන්දරයක් කීමක් හෝ යම් අදහසක් ප්‍රකාශ කිරීමක් විය හැකිය. ප්‍රභේදය තාක්ෂණික කලාත්මකභාවය, සහ ස්වභාවිකත්වය හා එදිනෙදා චලනයන් වැළඳ ගනී. නූතන නර්තන ශිල්පීන් විසින් අනෙක් සංස්කෘතිවල අදහස් සහ අභාසයන් ද ඈදා ගනිති. අතීතය පැහැදිලිවම ප්‍රකාශ කරන පරිදි, නූතන නර්තනය නිරන්තරයෙන් වෙනස්වන කලාවක් වන අතර වෙනස්වෙමින්, එය නැවත නැවත සොයා ගනිමින්, අගය කිරීම නැවත අර්ථනිරූපණය කරමින්, ස්වයං-ප්‍රකාශනය සහ නවෝත්පාදනය දිරිමත් කරමින් මනුෂ්‍ය කොන්දේසිය ශක්තිමත්ව බබළවයි. ට්වයිලා තාර්ප් එය මෙසේ ලුහුඬින් දක්වයි: “ නවීනත්වයේ අඩුවක් නැත; නවීනත්වයේ තවත් ඇත. එය සිදු කර ඇති සියල්ලට වැඩි දෙයක් ඇත”.

වාර්මේන් පැට්රිෂියා වොරන්, සුසැන් යන්ග්‍ර්මන් සහ සුසැන් යුන්ග්ගේ දායකත්වයන්

පරිශීලන ග්‍රන්ථ


ඇකොසෙල්ලා, ජොඈන්. මාර්ක් මොරිස්. නිවු යෝක්: ද නූන්ඩේස් මුද්‍රණය, 1983, පිටු 65 – 66
Acocella, Joan. *Mark Morris.* New York: The Noonday Press, 1983, pp. 65-66

බේනක්, ජූලි. “ට්‍රේසින් ද ලැන්ග්වේජ් ඔෆ් බිල් ටී. ජෝන්ස්.” ද ඩ්‍රාමාර් රිවීව්, 49 වෙළුම, අංක 2 (ටී 186) ගිම්හානය 2005.
Bacon, Julie. “Tracing the Language of Bill T. Jones.” *The Drama Review*, Volume 49, Number 2 (T186) Summer 2005.

බාන්ස්, සැලී. ටර්ප්සික්රෝන් ඉන් ස්නීකර්ස්: පෝස්ට් මොඩර්න් ඩාන්ස්. බොස්ටන්: හියුටන් මිෆ්ලින් කම්පැනි, 1979.
Banes, Sally. *Terpsichore in Sneakers: Post-Modern Dance*. Boston: Houghton Mifflin Company, 1979.

කැස්, ජොආන්. ඩාන්සින් තෘ හිස්ට්රි. නිවු ජර්සි. ප්‍රෙන්ටිස්-හෝල්, සමාගම, 1993.
Cass, Joan. *Dancing through History*. New Jersey: Prentice-Hall, Inc., 1993.

කනින්හැම්, මර්සි (ඉන් කන්වර්සේෂන් විත් ජැක්ලින් ලෙස්චාවේ). ද ඩාන්සර් ඇන්ඩ් ද ඩාන්ස්. නිවුයෝක්: මැරියන් බොයර්ස් ඉන්කෝපරේෂන්. 1985.
Cunningham, Merce (in conversation with Jacqueline Lesschaeve). *The Dancer and the Dance*. New York: Marion Boyars Inc., 1985.

ඩෙෆ්රාන්ට්ස්, තෝමස්. ඩාන්සින් රිවිලේෂන්ස්: ඇල්වින් අයිලීස් රම්බොඩිමන්ට් ඔෆ් ඇෆ්රිකන් කල්චර්. නිවු යෝක්: ඔක්ෆ්ර්ඩ් යුනිවර්සිටි ප්‍රෙස්, 2004.
DeFrantz, Thomas. *Dancing Revelations: Alvin Ailey’s Embodiment of African American Culture*. New York: Oxford University Press, 2004.

මාසෝ, ජෝසෙෆ් එච්. ප්‍රයිම් මූවර්ස්: ද මේකර්ස් ඔෆ් මොඩර්න් ඩාන්ස් ඉන් අමෙරිකා. නිවුයෝක්: විලියම් මුරෝ ඇන්ඩ් කම්පැනි, ඉන්කෝපරේෂන් , 1977
Mazo, Joseph H. *Prime Movers: The Makers of Modern Dance in America.* New York: William Murrow and Company, Inc., 1977.

පීබීඑස් එයිට්-පාර්ට් සීරීස් ඩාන්සින්. ඩාන්සින් #7 “ද ඉන්ඩිවිඩුවල් ඇන්ඩ් ට්‍රැඩිෂන්. ප්‍රඩියුස්ඩ් බයි ජියෝෆ් ඩන්ලොප් ඇන්ඩ් ජේන් ඇලෙක්සැන්ඩර්. ටෙලෙස්ක්‍රිප්ට් බයි

BAM

ජෙරල්ඩ් ජෝන්ස් ඇන්ඩ් රෝඩා ගෲවර්; ස්ටෝරි බයි රෝඩා ගෲවර්, හොස්ට් ඇන්ඩ් නැරේටර්, රාවුල් ට්‍රුජිලෝ, 1993.
PBS Eight-Part Series *Dancing. Dancing #7* "The Individual and Tradition. Produced by Geoff Dunlop and Jane Alexander. Telescript by Gerald Jonas & Rhoda Grauer; story by Rhoda Grauer; host and narrator, Raoul Trujillo., 1993.

පෙන් රොඩ්, ජේම්ස් ඇන්ඩ් ජැනිස් ගුඩ් ප්ලැස්ටිනෝ. ද ඩාන්සර් ප්‍රිපෙයාර්ස්: මොඩර්න් ඩාන්ස් ෆෝ බෙගනින්ස්. 1998, අර්වින්: මේෆීල්ඩ් පබ්ලිෂින් කම්පැනි, 1998
Penrod, James and Janice Gudde Plastino. *The Dancer Prepares: Modern Dance for Beginners*. 1998, Irvine: Mayfield Publishing Company, 1998.

පෙර්පෙනේර්, ජෝන් ඕ. III. අප්‍රිකන්- අමෙරිකන් කොන්සර්ට් ඩාන්ස්: ද හාලෙම් රිනෙයිසන්ස් ඇන්ඩ් බියොන්ඩ්. 2001, අර්බන් ඇන්ඩ් චිකාගෝ: යුනිවර්සිටි ඔෆ් ඉලිනොයිස් ප්‍රෙස්, 2001.
Perpener, John O. III. *African-American Concert Dance: The Harlem Renaissance and Beyond*. 2001, Urbana and Chicago: University of Illinois Press, 2001.

රෙයිනෝල්ඩ්ස් , නැන්සි ඇන්ඩ් මැල්කම් මැක්කෝමික්. නෝ ෆික්ස්ඩ් පොයිට්ස්: ඩාන්ස් ඉන් ද ටුවෙන්ටීත් සෙන්චරි. නිවු හැවෙන්: යේල් යුනිවර්සිටි ප්‍රෙස්. 2003.
Reynolds, Nancy and Malcolm McCormick. *No Fixed Points: Dance in the Twentieth Century*. New Haven: Yale University Press., 2003.

www.trishabrowncompany.org/